# වැඩ බැරි දාස ගැන කතා

නිකොලායි නෝසව්



5



## සෝඩා වතුරෙන් දුවන රියෙන්
# වැඩ බැරි දාස
# ගමන් ගිය සැටි

KANOL PUBLISHING HOUSE (PVT) LTD.

# වැඩ බැරි දාස ගැන කතා

## නිකොලායි නෝසව් 5

# සෝඩා වතුරෙන් දුවන රියෙන්
# **වැඩ බැරි දාස**
# ගමන් ගිය හැටි

අනුවාදය - දැදිගම වි. රුද්රිගු

චිත්‍ර - බරීස් කලෞෂීන්

පරිගණක සැලසුම - මාලක ලලනජීව

මුද්‍රණය 2024



KANOL
PUBLISHING HOUSE (PVT) LTD.





යාන්ත්‍ර ශිල්පී ඉස්කුරුප්පුවා සහ ඔහුගේ අත් උදව්කාරයා වන මුරිච්චියා බොහොම දක්ෂ වැඩකාරයෝ. දෙන්නගෙම මූණුවර එක වගෙයි. ඉස්කුරුප්පුවා පොඩ්ඩක් උසයි, මුරිච්චිය චුට්ටක් මිටියි. දෙදෙනාම සම් කබා ඇඳලා. ඒ ගොල්ලන්ගෙ සාක්කුවල අඬු, පීරි, ඉස්කුරුප්පු නියන් ආදිය තිබුණා. ඔවුන්ගේ කබා සමින් මහපු ඒවා නිසා ඔය උපකරණවල බරට ඔරොත්තු දුන්නා. නැතිනම් ඒ ඇඳුම් ඉරිලා බොහොම කල්. ඒ දෙදෙනාම සමින් හදපු හිස්වැසුම් දමාගෙන සිටියා. ඇස් ආරක්ෂා වෙන කණ්ණාඩි දමාගෙන තමයි මේ දෙදෙනා වැඩ කරන්නේ.

මේ දෙදෙනා වාමනයන්ගේ පැට්රෝල් ලාම්පු, ලෝහ හට්ටි, කේතල ආදි දේ අලුත්වැඩියා කරනවා. ඒ වගේ වැඩ නැති වෙලාවට රෝද තුනේ පා පැදි වැනි දේ හදනවා.

ඔන්න හිටිහැටියේම ඉස්කුරුප්පුවායි, මුරිච්චියයි කම්මලේ දොර වහගෙන හොර රහසේ මොනවදෝ හදන්න පටන් ගත්තා. මාසයක් තිස්සේ ම ඒගොල්ල වැඩ කළා: පීරි ගෑවා, මුරිච්චි ඇණ සවි කළා, කාටවත් ඒ ගොල්ලන් හදන දේ පෙන්නුවේ නැහැ. පස්සෙ බැලින්නම් ඒගොල්ල හදලා තියෙන්නේ මෝටර් රියක්.



ඒ අපූරු මෝටර් රිය දුවන්නේ පැට්රෝල්, ඩීසල් වැනි තෙල්වලින් නොවෙයි. සිරප් සහිත සෝඩා වතුරවලින්. රිය මැද පදවන්නාගේ ආසනය. ඊට ඉස්සරහින් සෝඩා වතුර සහිත පීප්පය. ඒ සෝඩා වතුරෙන් පැන නගින ගෑස් වායුව, තඹ සිලින්ඩරයකට ඇතුළු වෙනවා. ගෑස් වායුවේ බලය යකඩ පිස්ටනය තල්ලු කරනවා. මෙලෙස පිස්ටනය ක්‍රියාකාරී වීම නිසා රියේ රෝද කරකැවෙන්නට පටන් ගන්නවා. රිය පදවන්නාගේ ආසනයට ඉහළින් සිරප් ටැංකිය සවිකරලා. සිරප් බටය දිගේ ගිහිල්ලා පීප්පයට වැටෙනවා. එය යන්ත්‍රයට තෙල් වාගේ පාවිච්චි වෙනවා.

කුසුම් පුරයේ වාමනයන් අතර ඒ වගේ සෝඩා වතුරෙන් දුවන මෝටර් රිය බොහොම තිබුණා. ඉස්කුරුප්පුවායි, මුරිච්චියයි හදාපු මෝටර් රියේ ඉතා වැදගත් අලුත් දෙයක් තිබුණා. එය තමයි, ඒ ගොල්ලන්ට ඕන වෙලාවට මී පැණිවලින් හදාපු සිරප් සමග සෝඩා බීම සඳහා විශේෂ රබර් නළයක් සාදා තිබීම. ආසනයේ වාඩිවෙලා සිරප් සහ සෝඩා බොන්නට පුළුවනි.





කඩිනම් රාල මේ මෝටර් රිය පැදවීමට ඉගෙන ගත්තා. කාටහරි ඕන වුණාම එයා බොහොම ආසාවෙන් මෝටර් රියෙන් ඒ ගොල්ලන්ට ඕන තැනට ඔවුන්ව ගෙන යනවා.

මී පැණි දාස නමැති වාමන කොල්ලා අනික් අයට වඩා වැඩිය ඔය රියෙන් යාමට ආසයි. මොකද දන්නවද එයාට ආසනයේ වාඩි වෙලා පැණි සිරප් එක්ක සෝඩා වතුර බොන්න පුළුවන් නිසා. වැඩ බැරි දාසත් නිතරම පාහේ ඔය මෝටර් රියෙන් ගමන් කළා. කඩිනම් රාල තමයි රිය පදවන්නා. තනිවම රිය පැදවීමට වැඩ බැරි දාසට ලොකු ආසාවක් ඇති වුණා. එයා කඩිනම් රාලට කතා කරලා මෙහෙම කිව්වා.

"කාර් එක මට දීපන්. මාත් කැමතියි කාර් එක එළවන්න"

"නුඹට බැහැ. මේක යන්තරයක්. මේ යන්තරේ ගැන දැනීමක් තියෙන්න ඕන," කඩිනම් රාල එයාට විරුද්ධ වුණා.

"දැන ගැනීමට තරම් දෙයක් ඔතන නැහැ. නුඹ එළවන හැටි මම දැකලා තියෙනවා. ගියර් දානවා, සුක්කානම කරකවනවා. එච්චරයි නොවැ. ඕකත් අමාරු වැඩක්ද?" වැඩ බැරි දාස කිව්වා.



“බැලූ බැල්මට නම් අමාරු නොවෙයි වගේ තමයි පෙනෙන්නෙ. නමුත් රිය පැදවීම අමාරුයි. නුඹ ඉගෙන ගන්නේ නැතුව එළවන්න පටන් ගත්තොත්, කාර් එකත් කඩා බිඳ දමලා, නුඹත් මැරිලා යාවි,” කඩිනම් රාල කිව්වා.

“නුඹ මට ඔහොමද සලකන්නෙ! හොඳයි, කමක් නැහැ. නුඹත් කවද හරි මගෙන් උදව්වක් ඉල්ලුවොත්, මමත් නුඹට උදව් කරන්නෙ නැහැ.”

දවසක් දා කඩිනම් රාල ගෙදර නැති වේලාවක වැඩ බැරි දාස ගෙවත්තේ නවතා තිබුණු මෝටර් රියට නැගලා ගියර් අදින්නයි, පැඩල් පාගන්නයි පටන් ගත්තා. මුල දී රිය එක තැනම තිබුණේ සෙළවෙන්නේවත් නැතිවයි. එහෙත්, හිටිහැටියේම මෝටර් රිය හඬක් පිට කරලා දුවන්න පටන් ගත්තා. වාමනයෝ කවුළුවෙන් මේක දැකලා ගෙවල්වලින් එළියට දුවගෙන ආවා.

“ඒයි මෝඩයා, නුඹ මොනවා කරනවද? පණ නහගන්න හදනවද?” ඒගොල්ල කෑ ගැහුවා.

“නුඹලා බය වෙන්න එපා! මම පණ නහගන්නට තරම් මෝඩයක් නොවෙයි.”



මෙහෙම පුරසාරම් දෙඩුවා විතරයි වැඩ බැරි දාස එළවපු මෝටර් රිය ගෙවත්තේ තිබුණු බලු කූඩුවේ හැප්පුණා.

"දඩිං, බිඩිං, ඩෝං!" බලු කූඩුව සුනේ සුන්. බුල්කා හොඳ වෙලාවට එළියට පැන්නා. බලු කූඩුවේ අයිතිකාර බල්ලගෙ නම බුල්කා.

"නුඹ කරන විනාශයක හැටි බලාපන්! වහාම කාර් එක නවත්වාපන්!" දක්සපාල කෑ ගැහුවා.

වැඩ බැරි දාස බයවෙලා මෝටර් රිය නැවැත්වීමට උත්සාහ කළා. එයා මොකක්දෝ යතුරක් කැරකැව්වා විතරයි, මෝටර් රිය තවත් වේගයෙන් දුවන්න පටන් ගත්තා. ගෙවැටත් සුනේ සුං! දඩිං, බිඩිං, ඩෝං! වැඩ බැරි දාසගේ ඇඟ පුරාම ලී පතුරු. එක ලී පතුරක් පිටට ඇනිලා. හිසේ පසුපසට තවත් ලී පතුරක් ඇනිලා.

වැඩ බැරි දාස සුක්කානම කරකවනවා. රිය ගෙවත්ත වටේ දුවනවා. වැඩ බැරි දාස බොහොම බය වෙලා යටිගිරියෙන් කෑ ගහනවා:

"අනේ සෝයුරනි! දොර ඇරපල්ලා! නැතිනම් ගෙවැට කුඩේ කුඩු වේවි!"





වාමනයෝ ගෙවත්තේ දොර ඇරියා විතරයි මෝටර් රිය මහ පාර දිගේ වේගයෙන් දුවන්න පටන් ගත්තා. මේ සද්දෙට මහ පාරට දුවගෙන ආපු අය දෙපස පෙළ ගැහිලා කෑ ගහන්න වුණා.

"පණ බේරාගනියව්!" වැඩ බැරි දාස මෝටර් රියෙහි වාඩි වෙලා කෑ ගහනවා.

දක්සපාල, ඈනුම් අරින්නා, ඉස්කුරුප්පුවා, එඩරු තෙල් දොස්තර සහ අනෙක් වාමනයෝ මෝටර් රිය පසු පසින් දුවගෙන ගියා. කොහේ දුවන්නද! මෝටර් රිය වේගයෙන් ඉදිරියට ගියා.

පාර දිගේ දුවන රිය නැවැත්වීමට වැඩ බැරි දාස දන්නෙ නැහැ.

ඔන්න අන්තිමේ දි මෝටර් රිය ගඟ අද්දර පාරේ පල්ලමට ආවා විතරයි, තුන් කුන්දුන් ගැහිලා පෙරළුණා. රියෙන් පිටතට වීසි වෙලා ගිය වැඩ බැරි දාස සිහි නැතුව බිම ඇද වැටුණා. සෝඩා වතුරෙන් දුවන මෝටර් රිය ගඟට වැටිලා ගිලුණා.





දක්සපාලයි, ඇනුම් අරින්නායි, ඉස්කුරුප්පුවායි, එඩරු තෙල් දොස්තරයි වැඩ බැරි දාසව අල්ලා ගත්තා. එයා සිහි නැතුව වැතිරිලා හිටිය නිසා එයා මැරුණා කියලා මේ හතර දෙනාම කල්පනා කළා. එයාව ඔසවාගෙන ගෙදර ගෙනාවා.

එයාව ඇඳක දැම්මා විතරයි, එයාට සිහිය ආවා. එයා ඇස් දෙක ඇරලා වට පිට බලලා, මෙහෙම ඇසුවා:

"අනේ සෝයුරනි, මම ජීවතුන් අතරද?"

"ඔව්, නුඹ ජීවත් වෙනවා. නමුත් නුඹේ ඇටකටු, ඇඟපත පිරික්සා බලන්න ඕන. දඟලන්නේ නැතුව ඉඳපන්," එඩරු තෙල් දොස්තර කිව්වා.

දොස්තර වැඩ බැරියාගේ ඇඳුම් ගලවලා පරීක්ෂා කරලා මෙහෙම කිව්වා.

"පුදුමයක හැටි, නුඹේ ඇටකටු කැඩිලා නැහැ. ඇඟ විතරක් සීරිලා තියෙනවා. ලී පතුරු ඇඟට ඇනිලා තියෙනවා. එච්චරයි"

"ඔව්, ලොකු ලී කෑල්ලක් මගේ පිටට ඇලුණා," වැඩ බැරි දාස කිව්වා.

"ලී පතුරු ඉඳිකටු වගේ ඇඟට කා වැදිලා. ඒවා ගලවා දමන්න ඕන," දොස්තර එහෙම කියලා හිස වැනුවා.

"මට වේදනාවක් ඇති වෙයිද?" බය වුණු වැඩ බැරියා ඇහුවා.

"චුට්ටක්වත් රිදෙන්නෙ නැහැ! මම ලොකුම ලී පතුර ඇදලා දාන්නම්."

"අයියෝ! රිදෙනවෝ!" වැඩ බැරියා කෑ ගැහුවා.



"මොන බොරුද? කොහේ රිදෙනවද?" දොස්තර පුදුම වුණා.

"අනේ, අනේ, බොහොම රිදෙනවෝ!"

"ඉවසාගෙන හිටපන්. රිදෙන්නෙ නැහැ. නුඹ වේදනාව සිතින් මවා ගන්නවා," දොස්තර ඔහුට සැර වුණා.

"අපොයි නැහැ. හැබෑටම රිදෙනවා!"

"නුඹ කෑ ගහන්නෙ මොකද? මම නුඹව කපනවද? මම නුඹව කැපුවේ නැහැ."

"රිදෙනවෝ! දොස්තර කිව්වට රිදෙන්නෙ නැහැ කියලා, මට නම් රිදෙනවා!" වැඩ බැරියා බෙරිහන් දෙයි.

"කෑ ගහන්න එපා! තවත් එක ලී පතුරයි ඉතුරු වෙලා තියෙන්නෙ, ඒකත් ගලවා දමන්නම්!"

"අපොයි එපා, ඒක එහෙම තිබුණාවේ! ගලවන්න එපා."

"එහෙම බැහැ. ඒක පැසවන්න පුළුවනි."

"අනේ අම්මෝ, රිදෙනවෝ!"

"ඔන්න ඒ ලී පතුර ගලවා දැම්මා! දැන් ඉතින් අයිඩින් ගාන එක විතරයි."

"අයිඩින් ගෑවාම රිදෙනවද?"

"නැහැ. කිසිම වේදනාවක් නැහැ. නුඹ කලබල නැතුව ඉඳපන්" දොස්තර කිව්වා.

"අයියෝ!"

"කෑ ගහන්නෙ නැතුව ඉන්නවා! කාර් එකේ නැගලා රවුම් ගහන්න පුළුවනි. වේදනාව ටිකකට වත් උහුලන්න බැහැ!"

"අනේ අම්මෝ, ඇඟ දනවෝ!"

"පොඩ්ඩක් දනවා වගේ දැනේවි. පසුව ඇරිල යාවි. දැන් මම උණ බලන කටුව තියන්නම්"

"උණ කටුව එපා. අනේ එපා!"

"ඒ මොකද?" දොස්තර ඇසුවා.

"මට රිදෙන්න පුළුවනි."

"උණ කටුවට රිදෙන්නේ නැහැ මිනිහෝ!"

"දොස්තර කිව්වට රිදෙන්නෙ නැහැ කියලා, පසුව හැබෑටම වේදනාව ඇති වෙනවා."



"හැබෑ කොල්ලෙක්! නුඹගෙ උණ බලන්න මම කවදාවත් උණ කටුවක් තියලා නැත්ද?"

"නැහැ"

"එහෙනම් නුඹට දැනේවි, උණ බලන විට කිසිම වේදනාවක් නැති බව." එඬරු තෙල් දොස්තර එසේ කියා උණ කටුව ගැනීමට යාබද කාමරයට ගියා.

වැඩ බැරි දාස වහාම ඇඳෙන් නැගිට, ජනේලයෙන් පිටතට පැන තම මිතුරා වන ගුණෝ හමුවීමට ගියා. දොස්තර උණ කටුවත් රැගෙන එන විට වැඩ බැරි දාස එතන නොසිටි නිසා මුමුනමින් මෙහෙම කිව්වා.

"ඔන්න ඉතින් ඔය වගේ ලෙඩකුව සුව කරන්නෙ කොහොමද! එයාට ප්‍රතිකාර කරන විට එයා ජනේලයෙන් පැනලා දුවනවා. ඒක මහා නොහොබිනා වැඩක්!"







වැඩ බැරි දාසගේ හපන්කම් ගැන තව දුරටත් ඔබ දැන ගැනීමට කැමති නම්, කුසුම් පුරයේ වැසියන් ගැන දැන ගැනීමට ඔබ ආශා කරතියි නම් මේ පොත් පෙළට අයත් අනික් පොත් කියවන්න:

ගුවනේ පා වෙන බැලුමක් සෑදීමට දක්සපාල කල්පනා කළ සැටි, සංචාරය සඳහා සූදානම් වීම


www.kanolbooks.com

Rs. 400/-

071 3493447 011 2760036

facebook.com/kanol publish

kanolpublish@gmail.com

83/16/A, Hokandara East, Hokandara

ISBN 978-624-5937-71-4

9 786245 937714

KANOL

PUBLISHING HOUSE (PVT) LTD.